වැඩ වීසා

තාවකාලික සේවකයන්

ඔබට එක්සත් ජනපදයේ වැඩ කිරීමට අවශ්‍ය නම් වීසාවක් නිබිය යුතුය. ලබාගත හැකි විවිධ ආකාරයේ රැකියා වීසා පිළිබඳ තොරතුරු හා ඒවා ලබාගත හැකි ආකාරය ගැන වැඩි විස්තර දැනගැනීමට http://www.travel.state.gov/visa/temp/types/types_1271.html වෙබ් අඩවියට පිවිසෙන්න.

වැඩ වීසාවක් සඳහා අයදුම් ක්‍රියාවලිය ඉතා සංකීර්ණ වන අතර, එක්සත් ජනපදයේ අයදුම්පත ගොනුකොට ඒ සියළුම ලිපිලේඛන (1-129 පෙත්සම හා අනුමත කළ I-797 පෙත්සමේ පිටපත්) ඔබේ සම්මුඛ පරීක්ෂණයේදී තානාපති කාර්යාලයට ඉදිරිපත් කිරීම සඳහා ඔබ වෙත එවීම එක්සත් ජනපද සේවා යෝජකයාගේ වගකීම වෙයි. බොහෝ අවස්ථාවන්හිදී අයදුම්කරුවන් එක්සත් ජනපද දේශීය ආරක්ෂක දෙපාර්තමේන්තුවෙන් (DHS) අනුමත කරන ලද වැඩ පෙත්සමක් ඉදිරිපත් කළ යුතුවේ. ඔබට එක්සත් ජනපදයේ වැඩ

කිරීමට රැකියාවක් පිරිනමා ඇත්නම් ඔබට එක්සත් ජනපදයේ නීත්‍යානුකූලව වැඩකිරීමට හැකිවන සේ ඔබේ සේවා යෝජකයා අනුගමනය කරන ලද ක්‍රියාමාර්ගය ගැන විමසන්න.

තාවකාලික ආගමික සේවකයින්

ආගමික කටයුතු සඳහා එක්සත් ජනපදයට එන විදේශිකයන් සඳහා R වර්ගයේ සංක්‍රමණික නොවන වීසා ලබාදීමට ආගමන හා ජාතිකත්ව පනතෙන් ඉඩ සලසා තිබේ. මෙහි සඳහන් නොරතුරු වලට වඩා වැඩි විස්තර ලබා ගැනීමට රාජ්‍ය දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවියට පිවිසෙන්න. http://www.travel.state.gov/visa/temp/types/types_1272.html

ආගමික සේවකයන් අර්ථ දැක්වීම

ආගමික සේවකයන්ට අයත් වන්නේ පිළිගත් නිකායකින් ආගමික පූජා පැවැත්වීමට බලය ලබා දී ඇති හා බවුතීස්මය හෝ එයට සමාන ආගමික චාරිත්‍ර පවත්වන පූජක පක්ෂයේ අයයි. මෙය ගිහි දේශකයන්ට අදාල නොවේ. ආගමික ජීවිතයක් යනු යම්කිසි ප්‍රතිඥාවක් ගැනීම වැනි ජීවිත කාලයටම කැපවීමක් පෙන්නුම් කරන ජීවිතයකි. මෙහෙණියන්, භික්ෂූන්, කන්‍යා සහෝදරියන් හා ආගමික පූජකයන් මෙයට උදාහරණ වේ. ආගමික ජීවනෝපායක් යනු සම්ප්‍රදායික ආගමික කටයුතුවලට සම්බන්ධ වූ ක්‍රියාකාරකම් වල නිරන්තරව යෙදී සිටීමයි. මෙයට උදාහරණ වන්නේ දේවමෙහෙය පවත්වන සේවකයෝ, ආගමික ගුරුවරු හෝ ගායක ගුරු, ධර්මාචාර්යවරු, ආගමික රෝහල් සේවකයෝ, මිෂනාරීවරු, ආගමික පර්වර්තකයන් සහ ආගමික නිවේදකයෝ ආදියයි. මෙයට පිරිසිදු කරන්නන්, නඩත්තු සේවකයන්, ලිපිකරුවන්, අරමුදල් ලබාගන්නන්, ප්‍රදානයන් අයදින්නන් හෝ එයට සමාන රැකියා අයත් නොවේ.

අවශ්‍යතා

අයදුම්කරු එක්සත් ජනපදයේ ලාභ සඳහා නොවන ආගමික සංවිධානයක් ඇති ආගමික නිකායක අව්‍යාජ සාමාජිකයෙක් විය යුතුය. ආගමික නිකාය හෝ එහි අනුබද්ධ ආයතන, බදුවලින් නිදහස් හෝ ආගමික නිකාය බදුවලින් නිදහස් තත්වයට සුදුසුකම් ලබා තිබීම; (සම්මුඛ පරීක්ෂණ අවස්ථාවේ මෙම ලේඛන ඉදිරිපත් කිරීම අවශ්‍ය වේ) ඇතුල්වීමට පෙර අවුරුදු දෙකක් අයදුම්කරු එම නිකායේ සාමාජිකයෙක් වී සිටීම; (සම්මුඛ පරීක්ෂණයේදී ලේඛන අවශ්‍ය වේ) අයදුම්කරු එක්සත් ජනපදයට ඇතුල්වන්නේ එම නිකායේ පූජකයෙකු ලෙස කටයුතු කිරීම පමණක් හෝ එම නිකායේ ආගමික ජීවිතයක් හෝ ජීවනෝපායක් ගතකිරීම හෝ එම නිකායට අනුබද්ධ සංවිධානයක වෘත්තීය මට්ටමින් හෝ එසේ නැතිව කටයුතු කිරීම සඳහා වීම; සහ මෙම වර්ගීකරණය යටතේ ඔහු හෝ ඇය මීට කලින් අවුරුදු පහක් එක්සත් ජනපදයේ ගතකර ඇත්නම් අයදුම්කරු මීට පෙර වසරේ එක්සත් ජනපදයෙන් පිටස්තර රටක ජීවත් වී තිබීම.

ඉගෙන ගන්න සහ දැනගන්න - ඔබේ හිමිකම්, ආරක්ෂාවන් සහ සම්පත

A-3, G-5, NATO-7, B-1 ගෘහ සේවක, H-1B, H-1B1, H-2A, H-2B හා J-1 වර්ගවල වීසා අයදුම්කරුවන්ට: එක්සත් ජනපද තානාපති කාර්යාලය හෝ විදේශ රටක කොන්සියුලර්

කාර්යාලයක ඔබේ වීසා සම්මුඛ පරීක්ෂණයට යාමට පෙර ඔබ මෙම පත්‍රිකාව කියවා තේරුම් ගැනීම ඉතා වැදගත් වේ. ඔබේ වර්ගයේ එක්සත් ජනපද වීසාවක් නිකුත් කිරීමට පෙර මෙය කියවා තේරුම් ගෙන තිබීම අත්‍යාවශ්‍ය වේ. එසේ කිරීමෙන් ඔබ එක්සත් ජනපදයට පැමිණීමෙන් පසු උදව් අවශ්‍ය වුවහොත් ඒ මගින් ඔබේ හිමිකම්, ආරක්ෂාවන් මෙන්ම ඔබට ලබාගත හැකි සම්පත් පිළිබඳව දැනගත හැකියි. ඔබේ වීසා සම්මුඛ පරීක්ෂණයේදී ඔබේ නීත්‍යානුකූල අයිතීන් හා ආරක්ෂාවන්ද ගැන ඔබේ දැනුවත් බව කොන්සුයුලර් නිලධාරියා තහවුරු කර ගන්නවා ඇත. පත්‍රිකාව කියවීමෙන් පසු අවශ්‍ය අවස්ථාවන් හිදී බැලීම සඳහා එය පහසුවෙන් ගත හැකි තැනක තබා ගන්න.